**සීතාවකපුර නගර සභාව - 2020**
**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
---------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය
-----------------------------

සීතාවකපුර නගර සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 219 වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සීතාවකපුර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබදව මා විසින් කර තිබුණ පහත සඳහන් නිර්දේශයන් ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1.2.3 (ආ) | ප්‍රචාරක දැන්වීම් ගාස්තු හිඟ මුදල වන රු.23,299 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| 1.2.3 (ඇ) | රු.230,700 ක පෞද්ගලික බස් නැවතුම්පළ ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 9.9 වගන්තිය ප්‍රකාරව වෙනත් විස්තීර්ණ ආදායම් තුළ ඇති අයභාරවල තෘප්ත නොකරන රජයෙන් වන පැවරුම් ස්කන්ධයේ වෙනම සංරචක වටිනාකම වත්කම් හා වගකීම් ප්‍රකාශයේ හෙළිදරව් කර නොතිබුණි. | අතපසුවීමකින් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ 12 සටහනෙහි එම මුදල දක්වා නොමැති බැවින් ඉදිරි වර්ෂයේදී නිවැරදිව ඉදිරිපත් කරමි. | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 11.9 වගන්තිය ප්‍රකාරව අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම් සඳහා වන ප්‍රතිපාදන සම්බන්ධයෙන් කාල පරිච්ඡේදය ආරම්භයේදී සහ අවසානයේදී ධාරණ අගය කාල පරිච්ඡේදය තුළදී එකතු කිරීම් සහා අඩුකිරීම් ප්‍රයෝජනයට නොගත් වටිනාකම් ආදිය පිළිබඳ සංසන්දනයක් හෙළිදරව් කර නොතිබුණි. | මෙම වර්ෂයේ මෙම තොරතුරු හඳුනාගෙන තිබූ බැවින් සංසන්දනයක් ඉදිරිපත් කිරීමට නොහැකි වූ අතර සංසන්දනයන් ලබන වර්ෂයේ සිට ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | 15.13 වගන්තිය ප්‍රකාරව නගර සභාවේ හුවමාරුවන හා හුවමාරු නොවන ගනුදෙනුවල ලැබිය යුතු දෑ වල අයකර ගත නොහැකි ලෙස ලියාහැරීමේ යම් වටිනාකම් හා ඒ සඳහා අනුමැතිය වෙන් වෙන් වශයෙන් හෙළිදරව් කළ යුතුය. මීට අමතරව අංක 2155/7 හා 2019 දෙසැම්බර් 24 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මගින් පනවා ඇති නගර සභා මූල්‍ය පරිපාලනයට අදාල ගිණුම් කටයුතු පිළිබද රීති අංක 227(iv) මගින්ද මේ පිළිබදව අවධාරණය කර තිබුණි. | ඉදිරි වර්ෂයේ සිට ඉදිරිපත් කරමි. | ප්‍රමිති හා ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදය අනුව මිලදී ගනු ලබන දේපළ, පිරියත හා උපකරණ මිලදී ගත් වර්ෂයේදී ක්ෂය නොකරන නමුත් සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් රු.93,530 ක් වූ පරිගණක සඳහා ක්ෂය වීම් රු.14,030 ක් ද මාතෘ සායන ගොඩනැගිල්ල වටිනාකම රු.10,235,000 ක් සඳහා ක්ෂයවීම් රු.255,875 ක් ද වශයෙන් ගිණුම්ගත කර තිබුණි. | 2021.12.31 දිනට අවසාන ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රමිත ප්‍රකාරව ගිණුම් තැබීම කළ යුතු වේ. |
| (ආ) | ගත් මිල රු.3,397,581 ක් වටිනා යන්ත්‍ර 14ක් වටිනාකම හඳුනාගත නොහැකි CCTV කැමරා 16 ක් හා උපාංග පද්ධතිය සහ මධ්‍යම පරිසර අධිකාරියෙන් ලැබුණු වටිනාකම සොයාගත නොහැකි LED දැන්වීම් පුවරුවේ වටිනාකම ප්‍රත්‍යාගණනය කර දේපළ, පිරියත හා උපකරණ ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | 2021.12.31 දිනට අවසාන ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | සියළුම දේපළ, පිරියත හා උපකරණ ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වර්ෂය තුළ සිදු වූ ගනුදෙනුවල ක්ෂය වටිනාකම් වූ රු.25,705,745 ක් සහ අතිරික්තයේ හෝ ඌනතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් රු.7,244,281 ක් ඇතුළත් නොකිරීමෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය අඩුවෙන් දක්වා තිබුණි. | 2021.12.31 දිනට අවසාන ගිණුම් සකස් කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පුනරාවර්ථන නොවන වියදම් සඳහා රජයෙන් කළ මාරු කිරීම් ලෙස රු.3,506,652 ක් ගිණුම්ගත කරනු වෙනුවට රු.35,066,521 ක් ගිණුම්ගත කර තිබූ අතර වත්කම් හා වගකීම් ප්‍රකාශනයේ හඳුනා නොගත් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස රු.31,559,869 ක් ගිණුම්ගත කරනු වෙනුවට රු.7,244,281 ක් ගිණුම්ගත කර තිබුණි. ඒ හේතුවෙන් වර්ෂයේ ලාභය රු.31,559,869 කින් වැඩියෙන්ද ස්කන්ධය රු.24,315,588 කින් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගන්නා ලද අයිතම පමණක් ස්ථාවර වත්කම් ලෙස ගිණුම්ගත කර ඇත. | නව ගිණුම් ප්‍රමිත අනුව ගිණුම් තැබීම කළ යුතුවේ. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේදී දේපළ, පිරියත හා උපකරණ රු.12,663,798ක් වූ පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණු අතර ප්‍රාග්ධන වියදම් සඳහා ණය හිමි වෙන්කිරීම් රු.22,834,692 ක් කෙරීගෙන යන වැඩ ලෙස ගිණුම්ගත කරනු වෙනුවට පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | පිළිගනිමි. ඉදිරි ගිණුම්වලින් නිවැරදි කිරීමට කටයුතු කරමි. | නව ගිණුම් ප්‍රමිත අනුව ගිණුම් තැබීම් කළ යුතුවේ. |
| (ඊ) | සේවක ඇප තැන්පත් රු.47,942 ක් සේවක ඇප තැන්පත් ගිණුම හා විවිධ තැන්පත් ගිණුම යන ගිණුම් දෙකෙහිම සටහන් කිරීම නිසා විවිධ තැන්පත් ගිණුම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි. | එකඟ වෙමි. | නිවැරදිව ගිණුම් තැබිය යුතුවේ. |
| (උ) | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ 6 වන පරිච්ඡේදය පරිදි පෙර වර්ෂවලට අදාළ මංමාවත්, බෝක්කු හා පාලම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළ යුතු රු.35,066,521ක් වූ මංමාවත්, බෝක්කු හා පාලම් ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගතකළ යුතු වුවද පුනරාවර්ථන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | මෙම සම්පූර්ණ මුදලම ස්ථාවර වත්කම් යන නිර්වචනයට ඇතුළත් නොවන බැවින් පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර ඇත. | දේපළ, පිරියත හා උපකරණ නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | කලින් ලද කඩකුලී රු.101,243 ක් හිඟ කඩකුලී ශේෂයෙන් අඩුකර දක්වා තිබුණි. | එකඟ වෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | කඩකුලී නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |

**1.6.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයන් 04කට අදාලව මුලා ප්‍රකාශන අනුව වටිනාකම හා උපලේඛන අනුව වටිනාකම අතර රු.8,631,773 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ගිණුම් අතර වෙනස්කම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂයය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| රු. 15,493,207 ක් වූ ගිණුම් විෂයයක් සඳහා අවශ්‍ය උපලේඛන විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | රු. 15,493,207 | වටිනාකම ගණනය කළ ආකාරය දැක්වෙන උපලේඛන | නිවැරදි නොවේ. සංශෝධිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | නිවැරදි වටිනාකම් ගණනය කළ ආකාරය ඉදිරිපත් කළ යුතුවේ. |

### 1.7 අනුකූල නොවීම්

#### 1.7.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| | නීති, රීති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| | (i) මු.රෙ 371(5) | දිගින් දිගටම පැවති එන නොපියවූ අත්තිකාරම් ශේෂය වන රු.492,046 පියවීමට කටයුතු කර නොතිබුණි. | මෙම අත්තිකාරම් මුදල සඳහා පවත්නා ලේඛන වලින් කිසිවක් සොයා ගැනීමට නොහැකි බැවින් එය කපා හැරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අත්තිකාරම් පියවීමට කටයුතු කළ යුතුවේ. |
| | (ii) මු.රෙ 571 (2) | තැන්පත් කළ දින සිට වර්ෂ 02ක ඉක්ම වූ ගිවිසුම් ඇප තැන්පත්, මිශ්‍ර තැන්පත්, ටෙන්ඩර් තැන්පත් ඇතුළු රු.35,558,106 ක පොදු තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වසර 02 ඉක්මවා ඇති තැන්පත් ආදායමට ගැනීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ආයතන සංග්‍රහයේ xix පරිච්ඡේදයේ 6.1 හා 7.2 වගන්ති | මෙම වගන්තිය ප්‍රකාරව නිල නිවාසයක සාමාන්‍ය බදු කාලය වසර 05ක් වුවද සභාව සතු නිල නිවාස 07ක අවුරුදු 24 කට වැඩි කාලයක් සභාවේ සේවකයින් පදිංචි වී සිටින අතර මේ සඳහා දණ්ඩන කුලිය කරගෙන නොතිබුණු අතර මෙම නිල නිවාසවල අනවසර ඉදිකිරීම් කර ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන බවක් නිරීක්ෂණය විය. | මෙම සියළු කරුණු සම්බන්ධව ඔවුන්ව දැනුවත් කර නීතිමය කටයුතු ආරම්භ කර ඇතත් මෙම ප්‍රශ්නය මේ තෙක් විසඳී නොමැති අතර ඒ සඳහා කටයුතු කරමින් පවතී. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.49,323,906 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.6,275,919 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වරිපනම් බදු | | |
| | සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟ වරිපනම් ශේෂය රු.13,716,283 ක් විය. | 2019 වර්ෂයේදී ජංගම සේවා 04 ක් ද 2020 වර්ෂයේ මුල් කාර්තුව තුලදී ජංගම සේවයක් පවත්වා ජනතාව වරිපනම් බදු මුදල් ගෙවීමට පෙළඹවීමක් සිදුකරමින් අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ආ) | කඩකුලී | | |
| | සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කඩකුලී ආදායම රු.4,723,745 ක් විය. | මෙම හිඟ මුදල අයකර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදුකරමින් පවතී. | හිඟ කඩකුලී අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | තානායම් කුලිය | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු තානායම් බදු කුලිය රු.2,747,043 ක් විය. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා ලිපි මගින් දැනුවත් කර ඇත. | අදාල හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |
| (ඇ) | දඩ | | |
| | 2020 දෙසැම්බර් 31 දිනට හිඟ දඩ ආදායම රු.465,807 ක් විය. | අයවීමට ඇති හිඟ දඩ මුදල අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | අයවිය යුතු දඩ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

නගර සභා ආඥා පනතේ (4) වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තව්‍යන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1** **හඳුනාගත් පාඩු**

**----------------**

අවිස්සාවේල්ල පිලිප් ගුණවර්ධන ක්‍රීඩාපිටිය වටා ඉන්ටර්ලොක් ගල් අල්ලා ඇවිදින මං තීරුවක් ඉදිකිරීමට 2019 වර්ෂයේ රු.1,000,000 ක ඇස්තමේන්තුවක් මත ග්‍රාමීය වැඩිහිටි සමාජයකට කොන්ත්‍රාත්තුව භාරදී තිබූ අතර 2020 දෙසැම්බර් 31 දින රු.200,000ක අත්තිකාරම් මුදලක් ගෙවා තිබුණි. ගල් ඇල්ලීමෙන් එම මං තීරුව සකස් කිරීමට නුසුදුසු බව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්‍රීඩා නිලධාරී දැනුම් දෙන ලදී.

ඒ වන විටද මං තීරුවේ කොටසක ගල් අල්ලා තිබුණි. පසුව සභාවේ උපදෙස් මත එම කොන්ත්‍රාත්තුව අත්හිටුවා මං තීරුවේ අල්ලා ඇති ගල් නැවත ගලවා සභා භූමියට රැගෙන විත් ඇති අතර ඒ වන විට කොන්ත්‍රාත්කරුගේ වටිනාකම රු.305,979 ක් විය. මෙම නිෂ්ඵල වියදමක් බව නිරීක්ෂණය විය.